became lazy and lethargic and not performing well at the polo games. The Veterinary Teaching Hospital (VTH) Elephant Clinic team diagnosed her condition as Filariosis, which was due to the presence of thousands of microscopic young filarial worms (microfilariae) in her blood resulting in a condition known as anemia (bloodlessness). Anemia had made this young female to be lazy and lethargic with a poor appetite. About a week ago we had treated Menike by injecting few medicines to her thigh muscles. That day she respectfully tolerated the commands of the mahout and tolerated our interventions.

When we visited Bentota next for the continuation of the treatment a few days later, we were able to see, from a distance, the mahout and the owner waiting for us at the beach with Menike by their side. A few minutes would have lapsed by the time we exchanged greetings with the owner and inquired about Menike's health. When we were ready to do the routine examinations, Menike was not in the place where she was originally standing. Instead, we saw her hiding behind a nearby coconut tree! Everybody knows that a coconut tree is not at all big enough to hide a massive body of an elephant, but Menike obviously did not realize that. According to her innocent calculations and justifications, she couldn't see us because both her eyes were covered by the coconut tree, and she was pretty sure that she was successfully hiding from us human subjects who had arrived to punch her back muscles with fat needles! Little did she know that though she cannot see us, we could see the rest of her massive body bulging out from both sides of the coconut tree!

In case the readers get the wrong idea that elephants like Menike are dumb animals that cannot even identify a person/s that had come to save her life, I would like to relate the next incident of a crouching elephant with a hidden plan.

An elderly male elephant Raja in the hill country was severely anemic and the owners were at the verge of giving up hope for his life, when he was presented to us. Once again he too was diagnosed as suffering from anemia due to filarial worms in blood. We started the treatment as in the case of Menike above, and injected the medicines to Raja. That day he was cooperative in the presence of the mahout and the owner.

A few days later, when we visited for the continuation of treatment, we saw the majestic elephant standing under a huge tree facing the road, peacefully eating coconut leaves. As our vehicle got closer to the gate of the land he was occupying, we saw him stop eating and turned his head slightly and straining his ears towards our vehicle. While we were getting down from the vehicle we were

පෝලෝ ක්‍රීඩාවේ දක්ෂතා නොදැක්වූ හෙයින් සැලකිලිමත් වූ මැණිකේගේ හිමිකරු පේරාදෙණියේ පශු වෛද්‍ය ශික්ෂණ රෝහලේ (VTH) අලි සායන කණ්ඩායමට දැන්වීමෙන් අනතුරුව ඇයගේ රෝගී තත්ත්වය ෆයිලේරියා (Filariosis) ලෙස හඳුනාගන්නා ලදි. ඇයගේ රුධිරයේ දහස් ගණන් ක්ෂුද්‍ර පණුවන් (microfilariae) පැවතීම හේතුවෙන් රක්තහීනතාව (රුධිර සෛල හීනතාව) ඇති වී තිබුණි. රක්තහීනතාවය නිසා මෙම තරුණ ගැහැනු අලියාට ආහාර රුචිය අඩුවීම සමඟ අලස සහ උදාසීන බවට පත් වී තිබුණි. මීට සතියකට පමණ පෙර අපි මැණිකේගේ කලවා මාංශ පේශීවලට බෙහෙත් කිහිපයක් එන්නත් කර ප්‍රතිකාර කර තිබුනි. එදින ඇය ඇත්ගොව්වාගේ අණ පිළිපැද, අපගේ මැදිහත්වීම් ඉවසුවා ය.

දින කිහිපයකට පසු නැවත ප්‍රතිකාර කිරීම සඳහා බේරුවලට ගිය විට, අප එනතුරු මැණිකේ පසෙකින් වෙරළේ ඇත්ගොව්වා සහ හිමිකරු බලා සිටිනු දැකගත හැකි විය. අපි අයිතිකරු සමඟ සුබපැතුම් හුවමාරු කරගෙන මැණිකේගේ සුවදුක් විමසා බැලීමට විනාඩි කිහිපයක් ගෙවී යන්නට ඇත. අපි සායනික විභාග කරන්න ලෑස්ති වෙනකොට මැණිකේ මුලින් හිටගෙන හිටපු තැන හිටියේ නැහැ. අපි දැක්කා ඇය අසල පොල් ගසක් පිටුපසට වී සැඟවී සිටිනවා! දැවැන්ත අලියෙකුගේ සිරුරක් සැඟවීමට තරම් පොල් ගසක් කිසිසේත්ම විශාල නොවන බව කවුරුත් දන්නා නමුත් මැණිකේ ඒ බව දැන සිටියේ නැතිබව පැහැදිලි ය. ඇගේ අහිංසක ගණන් බැලීම්වලට සහ සාධාරණීකරණයන්ට අනුව, ඇයගේ ඇස් දෙකම පොල්ගසට වැහී අපව නොපෙනී සිටී නිසා, ඇය සිතන්නට ඇති ඉඳිකටුවලින් ඇනීමට පැමිණි මිනිස්සුන්ගෙන් සාර්ථකව සැඟවී සිටියා ය කියා! ඇයට අපිව නොපෙනුනත්, ඇයගේ දැවැන්ත සිරුරේ ඉතිරි කොටස පොල්ගස දෙපසින් නෙරා එන අයුරු අපට පෙනෙන බව ඇය දැන සිටියේ නැත.

මැණිකේ වැනි හිලෑ අලි ඇතුන් තම ජීවිතය බේරා ගැනීමට පැමිණි අය/පුද්ගලයන් හඳුනා ගැනීමටවත් නොහැකි මෝඩ සතුන් යැයි පාඨකයන්ට වැරදි අදහසක් ඇති විය හැකිය. එනමුත් එය එසේ නොවන බව හොවා දැක්වීම සඳහා දොස්තරලගෙන් සැඟවීමට වෙනත් අලියෙකු දැරූ සැලසුමක් ගැන කියන්නට කැමැත්තෙමි.

කඳුකරයේ ජීවත් වූ වයෝවෘද්ධ 'රාජා' පිරිමි හස්තියා දැඩි ලෙස රක්තහීනතාවෙන් පෙළුණු අතර ඔහුව අප වෙත ඉදිරිපත් කරන විට අයිතිකරුවෝ ඔහුගේ ජීවිතය පිළිබඳ බලාපොරොත්තු අත්හැර සිටියෝ ය. ඔහු ද Filaria ක්ෂුද්‍ර පනු වර්ගය ආසාදනය වීමෙන් රක්තහීනතාවෙන් පෙළෙන බව ලේ පරීක්ෂාවෙන් හඳුනා ගන්නා ලදී. මැණිකේට වගේම නියමිත ප්‍රතිකාර ආරම්භ කර රාජාට බෙහෙත් එන්නත් කළෙමු. එදින ඔහු ඇත්ගොව්වා සහ අයිතිකරු ඉදිරියේ සහයෝගයෙන් කටයුතු කළේ ය.

දින කිහිපයකට පසු, ප්‍රතිකාර දිගටම කරගෙන යාමට අප පැමිණි විට, පාරට මුහුණලා ඇති විශාල ගසක් යට ඒ තේජාන්විත අලියා සාමකාමීව පොල්අතු කමින් සිටිනු දුටුවෙමු. අපේ වාහනය ඔහු සිටි භූමියේ ගේට්ටුව ළඟට ආවිට ම ඔහු කෑම කන එක නවත්වා මඳක් ඔළුව හරවාගෙන අපේ වාහනය දෙසට කන් හරවනවා අපි

amused to see Raja turning his back toward us by moving his feet ever so slightly like a ballerina, so as not to make any noise. Once again, Raja's innocent calculations and justifications were to move to a position in which he couldn't see us, assuming therefore, that we too cannot see him!

When we visited him the third time, armed with a blood report negative for microfilariasis, we saw Raja once again under the huge tree facing the road and eating peacefully. The moment we came to the gate, he dropped his food, looked in our direction, and started to greet us by trumpeting loudly with his long trunk over his massive head (known as the act of 'udaree'). That was an unmistakable gesture of happiness, perhaps thankfulness. He knew that the painful medicine shots, made him feel better and strong again.

Both Menike and Raja exhibited several important characters of elephants. Firstly, they were able to recognize, from a distance, the on-coming vehicle carrying human subjects who have the potential to cause them discomfort (by injections). This could be due to their sharp sense of hearing the sound of the particular moving vehicles which they would have previously registered in their minds. Their long-distance vision would have added to the re-cognizing the human subjects. However, an important thing to note is, both of them never attempted to attack or harm the human subjects at the second and subsequent encounters, which they could have done easily had they wanted to. I like to believe that this was because they recognized the human subjects as "good people' who had come to cure them of their discomfort or sickness! This character was profoundly exhibited by Raja.

I have observed this magnificent character in numerous other elephants that we treated, which I hope to share with you in the future.

(Although the incidents mentioned above are real, the common names of elephants mentioned here are fictitious and do not refer to particular elephants with same names)

දුටුවෙමු. අපි වාහනයෙන් බහින අතරේ රාජා කිසිත් සද්දයක් නොනගා, දෙපා සෙමින් සෙමින් හරවා ඔහුගේ ශරීරය අපට පිටුපෑ අයුරු දැකීමෙන්, අපව මුණගැසීමට ඔහුගේ ඇති අමනාපය හෝ හය මනාව පෙන්නුම් කළේය. නැවත වරක්, රාජාගේ අහිංසක ගණනය කිරීම් සහ යුක්තිසහගත කිරීම් වූයේ ඔහුට අපව නොපෙනෙන ඉරියව්වක සිටියොත් අපටත් ඔහුව නොපෙනේ යන උපකල්පනය යි.

පසුදිනෙක, මයික්රොෆයිලේරියාසිස් නොමැති බව තහවුරු කරන රුධිර වාර්තාවක් සහිතව අප තෙවැනි වරටත් රාජා බැලීමට ගිය විට, අපි දැක්කා රාජා සුවිසල් ගහ යට සාමකාමීව කෑම කනවා. අප ගේට්ටුව වෙත පැමිණි මොහොතේම, ඔහු කෑම බිම දමා, අප දෙස බලා, අපට උදරී කර (හොඬවැල හිස උඩට ගෙන) මහ හයියෙන් කුන්චනාද කර අපට ආචාර කිරීමට පටන් ගත්තේය.

එය නිවැරදිව ම සතුට හො ස්තුතිවන්තකම පෙන්නුම් කරන ඉරියව්වකි. ඖෂධ එන්නත් කළ විට වේදනාකාරී වුවත්, එයින් ඔහුට සුවයක් සහ ශක්තිමත් බවක් දැනුණු බව ඔහු දැන සිටිය බව පෙණුනි.

මැණිකේ සහ රාජා යන දෙදෙනාම අලි ඇතුන්ගේ වැදගත් චර්යා කිහිපයක් ප්‍රදර්ශනය කළහ. පළමුවෙන් ම, ඔවුන්ට අපහසුතාවයක් ඇති කළ හැකි (එන්නත් මගින්) මිනිසුන් රැගෙන එන වාහනය දුර සිට හඳුනා ගැනීමට ඔවුන්ට හැකි විය. මෙයට හේතුව පෙර දිනෙක ඔවුන්ගේ මනසෙහි ලියාපදිංචි වූ විශේෂිත වාහනයක එන්ජිමේ ශබ්දය තියුණු ලෙස ඇසිය හැකි වීම ය. එමෙන් ම, පෙර දිනෙක ඔවුන්ගේ ඇසට ගැටුණු මිනිස් රූපයක් දිගු දුරකින් සිටම දැක හඳුනා ගැනීමට ඇති හැකියාව යි. කෙසේ වෙතත්, මෙහිදී අලි ඇතුන්ගේ සැලකිල්ලට ගත යුතු වැදගත් චරිත ලක්ෂණයක් නම්, ඔවුන්ගේ අපහසුතා හෝ අසනීප තත්වයන් සුව කිරීමට පැමිණි කරුණාවන්ත වෛද්‍යවරුන් හඳුනා ගැනීමට ඇති හැකියාව යි. ඔවුන් දෙදෙනාම, දෙවන හා පසුව හමුවීම්වල දී ඔවුන්ට අවශ්‍ය නම් පහසුවෙන්ම අපහට පහර දීමට හෝ හානි කිරීමට හැකිව තිබුණත් කිසි විටෙකත් එවැනි දෙයක් උත්සාහ නොකළෝ ය. මෙයට හේතුව ඔවුන්ගෙ රෝග සුව කිරීම අරමුණු කරගෙන පැමිණි "යහපත් මිනිසුන්" ලෙස අපව හඳුනා ගත් නිසා යැයි මම විශ්වාස කරමි. මෙම චරිත ලක්ෂණය ඉතා ගැඹුරින් ප්‍රදර්ශනය කළේ රාජාය.

අපි ප්‍රතිකාර කළ තවත් අලි ඇතුන් රාශියකගෙ මෙම විශිෂ්ට චරිතය මම නිරීක්ෂණය කර ඇත්තෙමි, එය අනාගතයේදී ඔබ සමඟ බෙදා ගැනීමට මම බලාපොරොත්තු වෙමි.

(ඉහත සඳහන් කර ඇති සිද්ධීන් සත්‍ය වුවද මෙහි සඳහන් වන අලි ඇතුන්ගේ නම් මනඃකල්පිත ඒවා වන අතර එම නම් ඇති අලි ඇතුන් බොහෝ ගණනක් ශ්‍රී ලංකාවේ සිටී)



**Dr. Oswin Perera** (BVSc Ceylon, PhD Glasgow, FSLCVS) is a retired Professor of Farm Animal Production and Health, Faculty of Veterinary Medicine and Animal Science, University of Peradeniya. Previously, he worked for the United Nations at the Joint FAO/IAEA Division of Nuclear Techniques in Food and Agriculture in Vienna, Austria. His teaching and research were focused on reproduction of cattle, buffaloes and elephants, human – wildlife conflicts, and risks from zoonotic diseases. He was the Founder President of the Sri Lanka College of Veterinary Surgeons, and past Presidents of the Sri Lanka Veterinary Association and the Veterinary Alumni Association of Peradeniya. His hobbies include travel, hiking and wildlife photography.

# A Selection of Wild Friends from the Family Bovidae Captured through the Lens of a Large Animal Vet




Gaur (*Bos gaurus*; Sub-family Bovinae, Tribe Bovini) @ Periyar NP, India

The largest species among wild cattle, also known as Indian bison, it is native to South and South-East Asia. The population is estimated at around 21,000 mature animals and it is listed as 'Vulnerable' on the IUCN Red List. A sub-species was present in Sri Lanka (Bos gaurus sinhaleyus, Deraniyagala) and became extinct. The gestation period is around 9 months.




Cape Buffalo (*Syncerus caffer caffer*; Sub-family Bovinae, Tribe Bovini) @ Kruger NP, South Africa

The largest of the four subspecies of African buffaloes, it is native to Sub-Saharan Africa. Considered to be the most dangerous animal in Africa and has never been domesticated. The population is estimated at around 400,000 and decreasing. Listed as 'Near Threatened' on the IUCN Red List. The gestation period is 11.5 months.




Greater Kudu (*Tragelaphus strepsiceros*; Sub-family Bovinae, Tribe Tragelaphini) @ Sabi Sands Reserve, South Africa

A spiral-horned antelope endemic to Sub-Saharan Africa, it is the second largest antelope after the Eland. Males are much larger than females. The population is estimated at around 480,000 and declining due to habitat loss and poaching. Categorized as 'Low Risk' on the IUCN Red List. The gestation period is 8 months.




Nyala (*Tragelaphus angasii;* Sub-family Bovinae, Tribe Tragelaphini) @ Kruger NP, South Africa

A spiral-horned antelope, now restricted to a few countries in Southern Africa. The colour of females and juveniles is brown but becomes dark brown or grey when males become adults. The population is estimated at around 40,000 and the majority are in protected national parks or reserves. Categorized as 'Least Concern' on the IUCN Red List. The gestation period is 7 months.




Nilgai (*Boselaphus tragocamelus*;
Sub-family Bovinae, Tribe Boselaphini)
@ Ranthambore NP, India

The largest Asian antelope, it is present in most forest areas of the Northern Indian subcontinent. Females and juveniles are orange to tawny while adult males are bluish grey. They were introduced to Texas, USA, in the 1920s and have spread to several neighbouring states. The population in India is estimated at over one million. Categorized as 'Least Concern' on the IUCN Red List. Gestation lasts 8 - 9 months




Blue Wildebeest (*Connochaetes taurinus*;
Sub-family Acelaphinae, Tribe Alcelaphini)
@ Chobe NP, Botswana

Also called the brindled gnu, it is native to Eastern and Southern Africa. The most abundant big game species in the region, population is estimated at around 1.5 million. Categorized as ' Least Concern' on the IUCN Red List. The other species is the black wildebeest (Connochaetes gnou), which is now restricted to the southernmost parts of the continent. The gestation period is 8.5 months.




Sable Antelope (*Hippotragus niger*;
Sub-Family Hippotraginae, Tribe Hippotragini)
@ Upper Zambezi NP, Zimbabwe

Native to Eastern and Southern Africa, both sexes have ringed scimitar-shaped horns. Females and juveniles are chestnut to dark brown, while males begin darkening and turn black after three years. The population is around 75,000 and it is categorized as 'Least Concern' on the IUCN Red List. The gestation period is 9 months.




Bhutan Takin (*Budorcas taxicolor whitei*;
Sub-Family Caprinae, Tribe Ovibovini)
@ Takin Reserve, Bhutan

One of four sub-species, it is the national animal of Bhutan. A close relative of sheep and goats, lives at altitudes between 1,000 and 4,500 m. The population in the wild is between 7,000 – 12,000, and it is listed as 'Vulnerable' on the IUCN Red List. The gestation period is 7 - 8 months




Himalayan Goral (*Naemorhedus goral*; Sub-Family
Caprinae, Tribe Ovibovini) @ Takin Reserve, Bhutan

Native to the Himalayas from Pakistan to Bhutan, it lives at altitudes between 1,000 and 3,000 m. Like the Takin it is a close relative of sheep and goats. The current population size is not known but is declining significantly due to habitat loss and hunting for meat. Listed as 'Near Threatened' on the IUCN Red List. The gestation period is 6 - 7 months.




Sumatran Serow (*Capricornis sumatraensis*;
Sub-Family Caprinae, Tribe Rupicarini)
@ Taman Safari, Indonesia

Native to Africa and central Iran,
Also called the mainland serow, it is one of four sub-species that are found from Western India to South-East Asia. The current population size is not known but is declining significantly due to hunting for meat and its body parts, which are used in local medicine. Listed as 'Vulnerable' on the IUCN Red List. The gestation period is 7 months.



# අලි මිනිස් ගැටුම කළ යුත්තේ කුමක් ද ?

**වෛද්‍ය ඩී.ඩී. ගුණවර්ධන**

අද වනවිට අලි මිනිස් ගැටුම උච්චස්ථානයකට පත් ව ඇතැයි මතයක් මේ වනවිට සමාජයේ ඇතිවී තිබුණ ද, මිනිස් අලි ගැටුම් වාර්තා වී ඇත්තේ අද ඊයේ පමණක් නොව 1960 ගණන්වල සිට ය.

සුප්‍රකට පණාමුරේ සිදුවීමෙන් පසු සත්ව නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රකට විද්වතෙකු වූ ආචාර්ය මයිකල් පෙරේරාට 1965 වසරේ වැලිකන්දේ දී සිදු වූ අකරතැබ්බය එවකට එම ක්ෂේත්‍රයට සම්බන්ධ බොහෝ දෙනා දැනසිටි භයානක ප්‍රහසනයකි.

එනමුදු අලින් විසින් ගෙවල් බිඳදමන වගා පාළු කරන මිනිස්සු මරන සිදුවීම්වල පැහැදිළි වැඩිවීම පසුගිය වසර 30 ක කාලය තුළ ඉතා ඉහළ වැඩිවීමක් පෙන්නුම් කරයි.

මෙය හුදෙක් මනුෂ්‍ය ගහණයේ වැඩිවීම නිසා සිදුවූවක් නොව අලින්ගේ නිජ බිම් මිනිසුන් විසින් විසිවැනි හා විසි එක්වැනි සියවස් තුළ ආක්‍රමණය කිරීමෙන් ඇතිවූවකි. අලින්ගේ නිජබිම හෝ තිඹිරිගෙය වනුයේ එක් ප්‍රදේශයක් හෝ ස්ථානයක් නොව මුළු දිවයින පුරාම පිහිටි වන ගහණයයි. කලින් එකම වනාන්තරයක් වූ එය වත්මනෙහි කැබලි වී ඇත. අලි ඇතුන් උන්ගේ නිජබිමට සීමාවී දිවිගෙවන සතුන් කොටසක් නොවේ. ඈත හෝ මෑත අතීතයේ තම ගොදුරු බිම් ව තිබී පසුව මිනිස් ක්‍රියාකාරීත්වය හා ආක්‍රමණයට ලක්වූ නගර හා වාණිජ බිම් බවට පත් වාසස්ථානවලට පවා උන් හිදිසියේ ළඟාවෙති. මෙය සහ අන්තර් මහාද්වීපික පක්ෂි පර්යටනයන් ද පෘථිවි චුම්බක ක්ෂේත්‍රය හා බැඳුණු සංසිද්ධියක් බව ප්‍රකට වන අලි විශේෂඥයෙකු වූ දිවංගත වෛද්‍ය නන්දන අතපත්තුගේ මතය යි. තව ද චුම්බක ක්ෂේත්‍රය හා විශ්වයේ පැරණි ම තොරතුරු ගබඩාව වන ජාන තටාකය (Gene pool) අතර සම්බන්ධය ද මෙහි පදනම පැහැදිළි කරයි. බටහිර විද්‍යාවට තවමත් ඇතුලු නොවුණු පුනර්භව සංසිද්ධියට ද වර්ජිනියා විශ්වවිද්‍යාල මහාචාර්ය ස්ටීවන්සන් සහ ඔහුගේ අනුප්‍රාප්තික ජිම් ටකර්ගේ අධ්‍යයනයන් ද යම් එළියක් දිනක සපයනු ඇත.

මිනිස් අලි ගැටුම් ඇතිවන පරිදි අලි නිජබිම්වල වාසස්ථාන තැනූ මිනිස්සු මෙහි වැරැදිකරුවෝ ය.

අද වනවිට ශීඝ්‍ර ලෙස පහත වැටී තිබුණ ද දැනට සිටින අලි ද එම සංක්‍රමණික පුරුද්ද ක්‍රියාවට නගන සත්තු ය. මේ නිසා ඔවුන් එ දා භුක්ති විඳි ප්‍රදේශ නැවත තහවුරු කරන වැඩපිළිවෙලකින් පමණක් මිනිස් අලි ගැටුම අවම කළ හැකි ය.

මෙහි අනික් අදහස නම් දැනට දශක ගණනාවකට පෙර විල්පත්තු, යාල, කුමන, සිංහරාජ, වස්ගොමුව, හෝටර්න් තැන්න, මඩු ප්‍රදේශය මාදුරු ඔය ආදී මෙකී නොකී නම්වලින් වෙන වෙනම හැඳින්වූව ද ඒ සියල්ල එකට යාව තිබූ තනි වනාන්තරයක කොටස් බව නියම සත්‍යය යි. එනම් අලින්ට සැරිසැරීමට මෙම වන කොටස් යා කළ අලිමංකඩවල් සියල්ල සහ ජලධාර ප්‍රදේශයද නැවත වන සහ තෘණ වගාවෙන් තහවුරු කරන වැඩපිළිවෙලක් මගින් පමණකි, අලි මිනිස් ගැටුමට සැබෑ විසඳුම් සෙවිය හැක්කේ. ඒ සඳහා මේවායේ පැරණි සැලසුම් රාක්කවලින් එළියට ආ යුතු ය. අලි වැටවල්, අගල් ආදීන් ජනතා මුදල් සාක්කුවලට යවන වෙනත් ජාවාරම් හා සබැඳි වැඩ පිළිවෙලවල් ය.

ඊට අමතරව තල්ගස් වැටවල්, හණ පඳුරු වැටවල්, ගජ මදාරා වැටවල්, මී මැසි පෙට්ටි වැනි අලි විකර්ෂක ක්‍රමයන් ද තර්ජිත ගම්මාන වටා වගා කිරීම ද අනුපූරක පියවර ලෙස යොදාගත හැකිය. වගා සංග්‍රාමය නාමයෙන් රජයේ ඉඩම්වලට ඇති ඉල්ලුම සැලසුම් සහගත පාලනයක් යටතේ භාවිතය අවම කිරීම ද අවශ්‍ය ය. මේ අනුව මෙම විසඳුම ඒකාබද්ධ වැඩපිළිවෙලක් අවධාරණය කරයි. මෙවැනි වැඩ පිළිවෙලක් ඉදිරි වසර 10 තුළවත් ක්‍රියාත්මක නොවුණහොත් ශ්‍රී ලංකා අලි පරපුර ගෘහස්ත අලි අතලොස්සකට පමණක් සීමා වනු ඇති අතර අලි වැටවල්, අගලවල්, ස්ථාන මාරු (Translocations) යන සියල්ල මහවැලි කඩිනම් වැඩපිළිවෙලහි අරමුදල්වලින් 30% ක් නිලධාරීන් අත්පත් කරගත්තාක් වැනි සිදුවීම්වලට යටත් වනු ඇත. කෙසේ වුවද ස්ථාන මාරුවලින් නව ප්‍රදේශයේ අලි රැලට නව ජාන ඇතුලුවීමේ වාසිය ඇත.



# කිරි දෙනුන්ට දවස පුරා බීමට ජලය ලබාදී කිරි නිෂ්පාදන වැඩි කර ගනිමු.

වෛද්‍ය දීපික වන්නිනායක

**කිරි දෙනකට දවසකට වතුර කොච්චර අවශ්‍ය වෙනව ද ?**

ලීටර 20 ක් දෙන කිරි දෙනකට දිනකට වතුර ලීටර 130 ත් 150 ත් අතර ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා. නඩත්තුවට ලීටර 50 ක් සහ නිපදවන සෑම කිරි ලීටරයකටම ජලය ලීටර 4 ත් 5 ත් අතර ප්‍රමාණයක්.

**මේ ලීටර 130 ම බොන්න දෙන්න ඕන ද ?**

දිනක වතුර අවශ්‍යතාවෙන් කොටසක් කිරි දෙනට කෑම සමග ලැබෙනවා. උදාහරණයක් විදියට තෘණ කිලෝ 40 ක් කන කිරි දෙනකට ඒ තෘණ සමගම වතුර ලීටර 30 ක් විතර දිනකට ලැබෙනවා. සාමාන්‍යයෙන් තෘණවල වියලි පදාර්ථය තියෙන්නෙ 20 -25% ත් අතර ප්‍රමාණයක්.

ඒ කියන්නෙ තෘණ කිලෝ 40 ක් ගත්තම තෘණ තියෙන්නෙ කිලෝ 9 ක් විතර. ඉතිරි කිලෝ 31 ම ජලය. ඒ නිසා තෘණ කිලෝ 40 ක් කන කිරි දෙනකට කන ආහාර සමගම ජලය ලීටර 30 ක් පමණ ලැබෙනවා. ඉතින් දිනකට වතුර ලීටර 130 ක් ඕන කිරි දෙනකට වතුර ලීටර 30 ක්ම තෘණ සමග ලැබෙනවා. ඉතිරි ලීටර 100 ජලය ලෙස පානය කරන්න ඕන.

**පානීය ජලය ඇති තරම් නොලැබුනොත් කිරි නිෂ්පාදනය අඩු වෙනව ද?**

ඔව්.

ඔක්සිජන් වලට පස්සෙ කිරි දෙනකට වැඩිපුරම අවශ්‍ය සංඝටකය තමයි ජලය. කිරි වල 87% ක් ම තියෙන්නෙත් ජලයනේ.

ඒ කියන්නෙ කිරි ලීටර 20 ක් දෙන දෙනකගේ කිරි වල ඝන ද්‍රව්‍ය කිලෝ 2.6 ක් තියෙනකොට ඒකෙ ලීටර 17.4 ක්ම තියෙන්නේ ජලය.

ජලය පානය අඩුවෙනකොට ආහාර ගන්න ප්‍රමාණය අඩු වෙනවා.

ජලය පානය 40% කින් අඩු වුණොත් කිරි නිෂ්පාදනය 25% කින් අඩු වෙනවා.

**කිරි දෙනකට දවස පුරාම පැය 24 ම වතුර බොන්න දෙන්න ඕන ද ?**

කිරි දෙනක් ජලය පානය කරන්නේ උරා බොන ක්‍රමයට.
කිරි දෙනක් දවසකට 10 - 15 ත් අතර වාර ගණනක් මෙලෙස ජලය උරා බොනවා.
ඔවුන් එක් වරකට තත්පර 30 ක පමණ කාලයක් එක දිගට ජලය උරා බොනවා.
එහිදී එක් වරකට ජලය ලීටර 10 ක් පමණ ජලය පානය කරනවා.
දිනකට ජලය පානය කරන වාර ගණන 10ට වඩා අඩු වුණොත් කිරි දෙනක් දිනකට පානය කරන ජලය ප්‍රමාණය අඩු වෙනවා.
උදාහරණයක් විදියට දවසකට වාර 3 ක් 4 ක් ජලය ලබා දෙන කිරිදෙනක් දිනකට පානය කරන ජලය ප්‍රමාණය ලීටර 30 ත් 40ත් අතර ගාණකට සීමා වෙනවා.
නිදැලි ක්‍රමයට හදන අපේ රටේ බොහොමයක් කිරි දෙනුන්ට බොහෝවිට දිනකට ජලය පානය කරන්න ලැබෙන තුන් හතර වතාවක් පමණයි.
ඉතින් උපරිම නිෂ්පාදනයට යන්න අවශ්‍ය වතුර ප්‍රමාණය බොන්න ලැබෙන්නෙ නෑ.
නිපදවන කිරි ප්‍රමාණය අඩු වෙනවා.

**කිරි දෙනකගේ ජලය පානය කරන හැසිරීම් රටාව කොයි වගේ ද ?**

ඉහත ආකාරයට කිරි දෙනක් දිනකට විනාඩි 5 - 7 ත් අතර කාලයක් ජලය පානය කරනවා.
ඒ සඳහා කිරි දෙනක් වතුර භාජන අසල දිනකට විනාඩි 30 ක පමණ කාලයක් ගත කරනවා.

**කිරි දෙනක් වතුර බොනකොට නැවත වතුර භාජනය පිරෙන වේගය වැදගත් ද?**

කිරි දෙනුන් විනාඩියට ලීටර 20 ක පමණ වේගයකින් ජලය පානය කරනවා.

මේ නිසා වතුර භාජන සැකසීමේදී වතුර භාජන තුළට ජලය ගලා ඒමේ වේගය අවම විනාඩියට ලීටර 20 ක පමණ වේගයක්වත් තියෙන්න ඕන.

ඔබේ වතුර ටැංකිය හෙමින් හෙමින් පිරෙන වතුර ටැංකියක් නම් ඔබේ දෙනුන් අවශ්‍ය පමණට වතුර පානය කරන්නේ නෑ.

ඔවුන්ගේ කිරි අඩු වෙනවා.

**ගව නිවාසයට අවශ්‍ය වතුර භාජන ප්‍රමාණය තීරණය කරන්නේ කොහොමද ?**

කිරි දෙනක් වැඩිපුරම වතුර බොන්නෙ කිරි දීල ඉවර වුණුගමන් ම සහ කෑම කන අතරතුර.
මේ නිසා ගව නිවස තුළ සිටින සතුන්ගෙන් 15 % කට එකවර ජලය පානය කළ හැකි වන පරිදි වතුර ටැංකි සලසා තියන්න ඕන.
ගවගාල තුළ සතුන් 20 ක් සිටිනවානම් එකවර 3 දෙනෙකුට ඕනෑම අවස්ථාවක ජලය නිදහසේ පානය කළ හැකි වන ලෙස වතුර භාජන තියන්න ඕන.
එක සතෙකුට ජල භාජනයේ සෙ.මී. 75 ක පමණ දිගක් වෙන්වෙන්න ඕන.

ඒ නිසා සතුන් 20 ක් සිටින ගව නිවාසයකට අඩි 7 ක දිගින් යුතු ජල භාජනයක් අවශ්‍ය වෙනවා.
සතුන් 20 ට වැඩි වන විට එම ගව නිවාසයට ජල භාජන 2 ක් තියන්න ඕන.

**ගව නිවාසයක ජල භාජන තියන්න ඕන පරතරය කොහොමද?**

කිරි දෙනක් දිනකට ජලය පානය පිණිස මීටර 20 කට වඩා වැඩි දුරක් ඇවිදීමට සිදු නොවන පරිදි ගව නිවාසය තුළ වතුර භාජන පිහිට වන්න ඕන.

ඒ කියන්නේ ගව නිවාසය තුළ ජල භාජන දෙකක් අතර උපරිම පරතරය මීටර 40 කට වැඩි නොවන්න ඕන.
කිරි දෙනකට ජලය බීමට මීටර 20 කට වැඩිය යන්න වෙනවා නම් ඒ දෙන්නගේ ජලය පානය අඩු වෙනවා.

කිරි නිෂ්පාදනය අඩු වෙනවා.

**ජල භාජනයක ගැඹුර දිග පළල කොහොම වෙන්න ඕන ද?**

කිරි දෙනක් ජලය උරාබොනවිට ජලයේ ගැඹුර සෙ.මී. 7 ට අඩු විට කට ඇති තරම් ජලයේ ගිලී නොයාමෙන් කටේ දෙපසින් වතුර වෙනුවට සුළං ඇදීයාම සිදු වෙනවා.
මේ නිසා ජල භාජනවල ජලයේ ගැඹුර අවම සෙ.මී. 7 ට වැඩි වෙන්න ඕන.

සෙන්ටි මීටර 15 -30 ත් අතර වීම වඩාත් සුදුසුයි.
සතුන් 3 කට එකවර බීම සඳහා අඩි 7 ක් වත් දිග වෙන්න ඕන.
පළල සෙ.මී. 45 ක් වෙන්න ඕන.
වතුර භාජනයේ විවෘත මුහුණත පොළොව මට්ටමේ සිට සෙ.මී. 60 - 70 අතර උස වන පරිදි පිහිටවන්න ඕන.
උස සෙ.මී. 60 ට අඩු වුණොත් ඒකට ගොම මුත්‍රා වැටෙනවා. ජලය නිතරම අපවිත්‍ර වෙනවා.

කිරි දෙනුන් අපිරිසිදු ජලය බොන්න කැමති නෑ. ජලය අපිරිසිදු නම් ජලය පානය අඩුවෙනවා. කිරි නිෂ්පාදනය අඩු වෙනවා.

උස සෙ.මී. 70 ට වැඩි වුණොත් ජලය උරා බීම අපහසුයි. ජලය පානය අඩු වෙනවා.

**කිරි දෙනක් ඇති තරම් ජලය පානය කරල ද ඉන්නෙ කියල දැනගන්නේ කොහොම ද ?**

කිරි දෙනක් මුත්‍රා කරන විට මුත්‍රා වල පාට බලන්න ඕන.
ඔබගේ කිරි දෙනගේ මුත්‍රා වතුර පාටනම් ඇති තරම් ජලය පානය කරලා.
මුත්‍රා වල පාට කහ හෝ තැඹිලි නම් ඇති තරම් ජලය පානය කරලා නෑ.
මුත්‍රාවල පාට කහ හෝ තැඹිලි නම් ඔබේ කිරි දෙනුන් ජලය පානය අඩු නිසා උපරිම නිෂ්පාදනයේ නෑ.
වසු පැටවුන්ට ජලය ලබා දෙන්න ඕන කොහොමද ?
වසු පැටියෙක් ඉපදී පළමු දින සිටම ජලය ලබා දෙන්න ඕන.
වයස මාසයක් වන විට වසු පැටියෙක්ට දිනකට වතුර ලීටර 3 -5 ත් අතර ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා.
මාස 5 ක් වන විට දිනකට වතුර ලීටර 15 ක් පමණ අවශ්‍ය වෙනවා.

මතක තියා ගන්න
ජලය පානය 40% කින් අඩු වුනොත් කිරි නිෂ්පාදනය 25% කින් අඩු වෙනවා.
කිරි දෙනගේ උපරිම කිරි නිෂ්පාදනයක් සඳහා ජල භාජනවල

1. පිරිසිදු ජලය තිබීම.
2. පැය 24 පුරාම ජලය තිබීම.
3. නියමිත වේගයෙන් ජලය ගලා එන බව ගැන නිතර පරීක්ෂාරී වන්න.



# අපිට ගැළපෙන කිරි කර්මාන්තය කෙබඳු ද?



**වෛද්‍ය සුනෙත් දිස්නක**

කිරි කර්මාන්තය සඳහා විශාල වශයෙන් ඉඩම් අවශ්‍ය වෙනවා. ලංකාව වර්ග කි.මි. 65610 ක් පමණ ඇති රටක් වන අතර ජනගහනය මිලියන විසිදෙකක් ජීවත් වෙනවා. ලංකාවේ පුරවැසියෙකුට තනි පුද්ගලයකු වශයෙන් තමන් සන්තකයේ තියාගන්න පුළුවන් උපරිම ඉඩම් ප්‍රමාණය අක්කර 50 කට සීමා වෙනවා. කෙසේ වුවත් තනි පුද්ගලයන් සතු සාමාන්‍ය ඉඩම් ප්‍රමාණය බොහෝ විට නගරබද පර්චස් කීපයකටම සීමා වන අතර ග්‍රාමීයව එය අක්කරයක් හෝ කීපයක් විය හැකියි. ගවයින් ඇතිකිරීමේදී මෙම සතුන්ට අවශ්‍ය ආහාර නිෂ්පාදනය කිරීමට විශාල ඉඩකඩ ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා. එනම් නිදැලි ක්‍රමයට උලා කෑමට සතුන් හදන්නේ නම් එක සතෙකුට අක්කරයක් පමණ තෘණ භූමිය අවශ්‍ය වෙනවා. වඩා සූක්ෂ්ම ක්‍රමයට ගව පාලනය කරනවා නම් ඒත් අක්කරයකට උපරිම ගවයින් හතර දෙනෙකු පමණ පෝෂණය කළ හැකියි. ඒ අනුව බැලුවම ගව පාලනයට කොපමණ ඉඩම් ප්‍රමාණයක් තිබිය යුතු ද කියලා අපිට ගණන් හදා ගන්න පුළුවන්. ලංකාවේ මේ වන විට සිටින ගව ගහනය ලක්ෂ දහතුනක් විතර කියලා වාර්තා වෙනවා. ඒ අනුව එම සතුන් තෘණභූමිවල නඩත්තු කළොත් අක්කර ලක්ෂ 13ක් අවශ්‍ය වෙනවා කියලා පේනවා. වර්ග කිලෝමීටරයක් කියන්නේ අක්කර 247 ක් පමණ. ඒ කියන්නේ මෙම ගව ගහනයට උලා කෑම සඳහා ඉඩම් වර්ග කිලෝමීටර් පන්දහස් දෙසිය හැට තුනක් අවශ්‍ය වෙනවා. මෙම ප්‍රමාණය ඉතා විශාල භූමි ප්‍රදේශයක් වන නිසා ශ්‍රී ලංකාව වැනි රටකට එතරම් භූමි ප්‍රමාණයක් ගව පාලනය සඳහා වෙන් කළ හැකි ද යන්න කාලෝචිත ප්‍රශ්නයක්. ඉහත කී ගවයින් සංඛ්‍යාව යොදාගෙන නිෂ්පාදනය කරන කිරි ප්‍රමාණය දිනකට ලක්ෂ 13 ක් පමණ වෙනවා. එම ප්‍රමාණය දේශීය කිරි අවශ්‍යතාවෙන් සියයට හතළිහක් පමණයි. ඒ අනුව තවත් ලක්ෂ පහළොවක් පමණ කිරි නිපදවිය යුතු වෙනවා. එසේ නම් ඒ සඳහා තවත් ගවයින් ලක්ෂ පහළොවක් පමණ හා තවත් අක්කර ලක්ෂ පහළොවක් පමණ වෙන් කිරීමට අපට හැකියාව තිබේද?.

ශ්‍රී ලංකාව ජන ඝනත්වය අතින් ඉතා ඉහළ රටක්. ඉඩම්වල වටිනාකම ඉතා ඉහළයි. සීඝ්‍රයෙන් ඉඩම් මිල ඉහළ යමින් තිබෙනවා. ලංකාවේ බොහොමයක් ප්‍රදේශවල ඉඩම් ජනතාව පදිංචි වීම සඳහා යොදාගෙන තිබෙනවා. එම තත්ත්වය තුළ තවදුරටත් ඉඩම් කැබලි වෙමින් සීමාසහිත වෙමින් පවතිනවා. ගව පාලනයට අලුතෙන් ඉඩම් එකතු කිරීම එතරම් ප්‍රායෝගික නැහැ. දැනටමත් ඉහත සඳහන් කළ ගවයින්ගෙන් විශාල සංඛ්‍යාවක් ආහාර සොයා ගන්නේ වන ප්‍රදේශවල හෝ වගා නොමැති කාලයේදී වගා ඉඩම් වල උලා කෑම මගිනි. එබැවින් තවදුරටත් මෙම සාම්ප්‍රදායික ගව පාලනය තුළින් ශ්‍රී ලංකාවට අවශ්‍ය කිරි නිෂ්පාදනය සිදුකළ නොහැකි බවයි මගේ නිගමනය. දැනටමත් මෙම පැරණි ගව පාලනය විශාල තර්ජනයකට ලක් වී තිබෙනවා. වන සංරක්ෂණ ආයතන සතු ඉඩම්වලට ගවයින් ඇතුළු වීම නිසා වන සතුන්ට ආහාර හිඟ වීම විශාල ගැටලුවක් වී තිබෙනවා. එබැවින් තෘණ භූමි මත යැපුණු ගව කර්මාන්තය ශීඝ්‍ර ලෙස කඩා වැටෙමින් පවතිනවා.

රජය සතු ප්‍රයෝජනවත් කාර්යයකට භාවිත නොකළ මුඩුබිම් රට පුරා විශාල වශයෙන් පවතිනවා. මෙවැනි ආර්ථික වටිනාකමින් අඩු ඉඩම් කිරි නිෂ්පාදන කර්මාන්තයට යොදා ගැනීම අවශ්‍ය වෙනවා. එහිදී ඒකක ඉඩකින් හා එක සතෙකුගෙන් උපරිම නිෂ්පාදනයක් ලබාගත හැකි ආකාරයට මෙය සිදුවිය යුතුයි. එනම්, අක්කරයකින් වැඩි සතුන් ප්‍රමාණයක් නඩත්තු කළ යුතුයි. එසේ ගණන් බැලුවහොත්, රටට



අවශ්‍ය අමතර කිරි ලක්ෂ 15 නිපදවීමට ගව දෙනුන් අවශ්‍ය වන්නේ එක් ලක්ෂ පනස් දහසක් පමණ බවත් එම සතුන් සඳහා අක්කර හතළිස් දාහක් පමණ ප්‍රමාණවත් බවත් පෙනී යයි.

තවදුරටත් අධ්‍යයනය කළහොත් පෙනී යන්නේ වර්තමානයේ පවතින අඩු නිෂ්පාදන ඵලදායිතාවක් සහිත ගව කර්මාන්තය නඩත්තු කිරීම් සඳහා රජය විසින් භාණ්ඩාගාරය හරහා විශාල වියදමක් දරණ බවයි. එසේ නොමැතිව ඉහත කී පරිදි අක්කර හතළිස් දාහක් පමණ යොදාගෙන සිදුකරන ලීටර් ලක්ෂ පහළොවක් දිනකට නිපදවීමේ සැලැස්ම පෞද්ගලික අංශය වෙත පැවරීම වඩා යෝග්‍ය වෙයි. ඒ සඳහා පවතින සීමාකාරී සාධක වනුයේ ඉඩම් හා ආයෝජන වියදමයි. මා පෙර ද සඳහන් කළ පරිදි විශාල ඉඩම් පුද්ගලයින් සතුව නොමැති බැවින් ඒවා රජය විසින් දීර්ඝකාලීන බදු පදනම් මත පුද්ගලයින් හෝ ආයතන වෙත ලබා දිය යුතුයි. ගව පාලනය සූක්ෂ්ම ලෙස සිදු කිරීමට විශාල ආයෝජනයක් සිදු කළ යුතු බැවින් ඒ සඳහා ණය පහසුකම් ලබා දිය යුතුයි. උසස් ආරයේ ගවයින් යොදා ගෙන ආරම්භ කරන ගොවිපොළකට දළ වශයෙන් එක් සතෙකුට රුපියල් මිලියනයක් පමණ වැය වේ යැයි අපේක්ෂා කළහොත් ඉහත සඳහන් ගවයින් 150,000 සඳහා රුපියල් බිලියන 150 ක් පමණ වැය වෙයි. 2019 වර්ෂයේ පමණක් කිරිපිටි හා වෙනත් කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සඳහා ශ්‍රී ලංකාව විසින් වැය කර ඇති මුදල රුපියල් බිලියන 55 කි. සෑම වර්ෂයකම මෙවැනි විශාල මුදලක් ශ්‍රී ලංකාවෙන් පිටතට ගලා යාම ඉහත ආයෝජනය මගින් නතර කළ හැකියි. එබැවින් මෙය දීර්ඝකාලීනව වාසි ගෙන දෙන මෙන්ම වර්තමානයේ ශ්‍රී ලංකාව පීඩා විඳින විදේශ විනිමය අර්බුදය අවම කරගැනීමට ද පිටිවහලක් වනු ඇත.

ඉහත යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන තවත් සීමාකාරී සාධකයක් වනුයේ ශ්‍රී ලංකාව තුළ උසස් ආරයේ සතුන් ඉතා දුලබ වීම යි. කිසියම් කෙනෙකු සිතනවා නම් මෙම අවශ්‍ය සතුන් 150,000 අප රට තුල ම නිපදවා ගත හැකි බව එය කිසිසේත් ප්‍රායෝගික නොවේ. උදාහරණයක් ලෙස කිරි ගව අභිජනන ගොවිපොළක නිපදවන පැටවුන් සංඛ්‍යාව ගණන් බැලීමෙන් මෙය තහවුරු කරගත හැකියි. එනම් කිරි ගවයින් දහසක් නඩත්තු කිරීම මගින් වසරකට උපදවා ගත හැකි ගැහැනු පැටවුන් සංඛ්‍යාව 400ක් පමණ වේ. එම පැටවුන් හාරසීයයෙන් දෙසීයක් පමණ එම ගොවිපොළෙහිම අවශ්‍යතාව සඳහා රඳවා ගත යුතු බැවින් වෙනත් ගොවීන් වෙත එම ගොවිපොළෙන් ලබාදීමට හැකි වන්නේ වසරකට උපරිම වශයෙන් ගැහැනු පැටවුන් දෙසීයක් පමණයි. එනම් ඉහත කී ගවයින් 150,000 නිෂ්පාදනය කිරීමට එක් වසරකදී දී කටයුතු කරන්නේ නම් අභිජනන දෙනුන් එවැනි පස්ණගුණයක් අවශ්‍ය වේ. ශ්‍රී ලංකාව තුළ උසස් ආරයේ දෙනුන් එපමණ ප්‍රමාණයක් නොමැතිබව ඉතා පැහැදිලිය.

**එසේ නම් කළ යුත්තේ කුමක්ද,**

උදාහරණයක් ලෙස, මීට වසර කීපයකට පෙරදී තම රටට සම්බාධක දැමූ අවස්ථාවේ දී කටාර් රාජ්‍යය ක්‍රියා කළ ආකාරය සොයාබැලිය හැක. ඒ අවස්ථාවේ තම රටේ ජනතාවට අවශ්‍ය කිරි නිෂ්පාදනය රට තුළම නිපදවා ගැනීමට සිදුවීම නිසා ගුවන් මගින් එළදෙනුන් විසිදාහක් ආනයනය කරන ලදී. ලෝකයේ රටවල් ගවයින් ආනයනය හා අපනයනය ඉතා සුලබව සිදු කරයි . 2019 වසරේ දී පමණක් ඕස්ට්‍රේලියාව ගවයින් ලක්ෂ 12ක් පමණ අපනයනය කර තිබේ. යුරෝපය ඇමරිකාව ඇතුලු රටවල් රාශියක් සතුන් අපනයන කටයුතු ඉතා සුලභව සිදු කරයි. එවැනි වූ ව්‍යාපෘති ආරම්භ කිරීම මගින් පෞද්ගලික අංශය රටේ කිරි නිෂ්පාදනයට දායක කරගැනීම අවශ්‍ය වේ. එමගින් වසර ගණනාවක් තිස්සේ ඉතා මන්දගාමී ලෙස සිදු කෙරමින් පවතින කිරි නිෂ්පාදන කර්මාන්තය වඩා වේගයෙන් දියුණු කරවා ගත හැකි අතර එය රටේ ආර්ථිකයට ද ශක්තියක් වනු ඇත.



# அறிமுகம் - கோழிகளுக்கு செயற்கை முறை சினைப்படுத்தல் செய்யும் முறை

**Dr. M.J.Nowshad Jamaldeen**

செயற்கை முறை சினைப்படுத்தலானது முதலாவதாக 1920ஆம் ஆண்டு அமெரிக்காவில் அறிமுகப்படுத்தப்பட்டது. இது 1950ஆம் ஆண்டளவில் பரந்தளவில் அவுஸ்திரேலியாவில் நடைமுறைப்படுத்தப்பட்டது.

செயற்கைமுறை சினைப்படுத்தல் என்பது சேவல் கோழிகளின் விந்து கலங்களை பெண் கோழியின் இனப்பெருக்க குழாயில் செலுத்துவதாகும் இதற்கு 2 படிமுறைகள் காணப்படுகிறது.

1. விந்துகளை சேவல் கோழிகளிலிருந்து சேகரித்தல்
2. சேகரிக்கப்பட்ட விந்துகலங்களை பெண் கோழியின் இனப்பெருக்க குழாயினுள் செலுத்துதல்

சாதாரணமாக 1 சேவல் கோழியானது 0.1 ml-0.5 mlவரை 1 தரத்தில் வெளியேற்றும். ஆனால் இது கோழிகளின் இனங்களுக்கிடையிலும் மற்றும் ஒவ்வொரு கோழியின் தனித் தன்மையிலும் தங்கியுள்ளது. அதாவது சில இன கோழிகள் 0.5 mlஐ விட அதிகமாகவும் தரக் கூடும். கோழிகளில் இருந்து விந்துகளை சேகரிப்பதற்காக 2 முறைகளில் பயன்படுத்தப்படும்.

1. முதுகுப் பகுதியில் மசாஜ் பண்ணுதல்
2. வயிற்றுப் பகுதியில் மசாஜ் பண்ணுதல்

சில வேளைகளில் இரு முறையும் பாவிக்கப்படலாம் சில வேளைகளில் மசாஜ் தேவையில்லாமலும் சேகரிக்கப்படலம். வயிற்றுப் பகுதியை மசாஜ் பண்ணும் போது சேவல் கோழிகளிலிருந்து எச்சம் மற்றும் சிறுநீர் விந்துக்கலங்களுடன் கலப்பதற்கு சில வேளைகளில் சிறிதளவு இரத்தம் கலக்க வாய்ப்பு உள்ளது. இவை விந்துகலங்களை ஐதாக்கும் போதும் இவற்றுடன் கலந்திருப்பதால் சினைப்படுத்தல் பாதிக்கப்படலாம். ஆகவே வயிற்றுப் பகுதியை மசாஜ் பண்ணும் போது அதிக கவனம் தேவைப்படும்.

சினைப்படுத்தல் முறையானது சிறிய உபகரணங்களை கொண்டு மிகவும் துப்புரவான முறையில் மேற்கொள்ளப்படும் தற்பொழுது இச் செயற்கை முறை சினைப்படுத்தலானது சிறந்த தரமுடைய கோழிகளை உண்டாக்குவதற்கு பயன்படும்.

## நோக்கம்

1. தேவையான அளவு விந்துக் கலங்களை பேட்டுக் கோழிகளின் இனப்பெருக்க குழாயினுள் உள்ள விந்து சுரக்கும் சுரப்பியினுள் செலுத்துதல்
2. செயற்கை முறை சினைப்படுத்தலானது சிறந்த ஆரோக்கியமும் நலமும் கொண்டதாக பெண் கோழிகளுக்கு அமைவதால் அதி உச்ச குஞ்சு பொரிதிறனை அதிகரிக்கும்.

## தேவையானபொருட்கள்

1. Extension Agent (sodium Glutamates)
2. PP tube
3. Plastic cups(10ml)
4. Disposable Tuberculin Syringe(1cc)

## விந்து கலங்கள் தயாரித்தல்

செயற்கை முறை சினைப்படுத்தல் செய்வதற்கு முன் தேவையான பொருட்கள் தயாரிக்கப்படுகிறன சோடியம் குளுட்டா மேட் ppகுழாயில் 0.6ml அளவில் எடுக்கப்படும். அத்துடன் 0.3ml விந்துக் கலங்கள் சேகரிக்கப்பட்டு அவை இரண்டையும் கலப்பதன் மூலம் மொத்தமாக 0.9ml தயாரிக்கப்படும் இதனை ஒரு கோழிக்கு 0.1 ml வீதம் 9 கோழிகளில் செலுத்தலாம்.

## நன்மைகள்

1. இனப்பெருக்க வீதம் அதிகரிக்கும்.
2. அதி சிறந்த வயதான சேவல் கோழிகளையும் பயன்படுத்த முடியும்.
3. காயப்பட்ட சேவல் கோழிகளையும் பயன்படுத்தலாம்
4. இயற்கையான முறையில் நடைபெறும் விருப்பத்திற்குரிய பெருக்கம் நீக்கப்படும்
5. வெற்றிகரமான இனக்கலப்பு நடைபெறும்
6. இம்முறை மூலம் கொள்ளைப்புற இறைச்சிக் கோழிகளையும் இலகுவாக உருவாக்க முடியும்.

மேலும் மேற் குறிப்பிட்டவாறு விந்துக்கலங்களைத் தயாரித்து அவற்றை பண்ணையாளர்களிடமுள்ள கோழிகளை இனக்கலப்புச் செய்வதன் மூலம் கலப்பினக் கோழிகளை உற்பத்தி செய்ய முடியும். அதாவது அதிகமாக முட்டையிடும் இனச் சேவல்களிடமிருந்து பெறப்படும் விந்துகளை பாவித்து கலப்பிறப்பாக்கம் செய்ய முடியும். அதேபோல் இறைச்சி இனச் சேவல்களை கொண்டும் கலப்பினம் உருவாக்கப்படலாம்.

இவற்றின் மூலம் பண்ணையாளர்களிடமுள்ள கொல்லைப்புறக் கோழிகளை தரவேற்றம் செய்வதன் மூலம் அதிகமான முட்டை , இறைச்சினை உற்பத்தி செய்யும் கோழி இனங்களை உருவாக்க முடியும்.

மேற்குறித்த முறையானது கால்நடை வைத்திய காரியாலயங்களில் மிக இலகுவாக, தெரிவு செய்யப்பட்ட பண்ணைகளில் மேற்கொள்ள முடியும். இதனால் கிராமப்புறங்களில் தரமுயர்த்தப்பட்ட சிறந்த கோழிக்குஞ்சுகளை ஏனைய பண்ணையாளர்களுக்கு மிகவும் குறைந்த விலைகளில் வழங்க முடியும்.

குறித்த கோழி இனங்களால் உள்ளூரில் உற்பத்தி செய்யப்படும் விவசாய மற்றும் விலங்கு கழிவுகளை குறைந்த விலையில் தீனிகளாக பயன்படுத்த முடியும்.

தற்போது நாட்டில் ஏற்பட்டிருக்கும் பொருளாதார பிரச்சினைகளால் ஏற்படப்போகும் உணவுப் பற்றாக்குறையை ( புரதப் பற்றாக்குறை) மிகவும் குறைந்த முயற்சி மற்றும் குறைந்த செலவீனங்களின் ஊடாக நிவர்த்தி செய்ய முடியும்.

சிறந்த முறையில் கால்நடை வைத்திய காரியாலயங்களினால் இச் செயற்பாடு நடைமுறைப்படுத்தப்பட்டால் உள்ளூர் உற்பத்தி அதிகரிக்கும், பண்ணையாளர்களின் வருமானம் அதிகரிக்கும், வெளிநாட்டுச் செலாவணி மீதப்படுத்தப்படும் அத்துடன் ஒரு புதிய வகை கோழி இனம் கொல்லைப்புறங்களில் வளர்க்கப்படும்.

| புகைப்படம் | செயற்பாடு | விளக்கம் | கருத்து |
|---|---|---|---|
|  | 01.தேவையன அனைத்து பொருட்களையும் சேகரித்தல் | ppகுளாய் பிளாஸ்ரிக் கப் மற்றும் டிஸ்போசபிள் எக்ஸ்டென்சன் ஏஜென்ட் சிரிஞ்ச் டியூபர் குலின் சிரிஞ்சில் 0.6mlஎக்டென்சன் ஏஜென்டை சேகரித்து pp குளாயில் வைக்கவும். | 100ml காய்ச்சி வடிகட்டிய தண்ணீருக்கு 3.6-3.8 கிராம் சோடியம் குளுட்ட மேட் வடிகட்டுவதற்குபயன்படு த்தப்படுகிறது. |
|  | 02. சேவல் | கூண்டின் கதவைத் திறந்து கூண்டை மெதுவாக பிடித்து வலது கையால் சேவல் கோழியின் கால்களை பிடித்து பக்கவாட்டில் திருப்பி கூண்டிலிருந்து வெளியே இழுக்கப்படுகிறது | |
|  | 03. மசாஜ் | வலது கையால் சேவலின் கால்களை பிடித்துக் கொண்டே இருக்க வேண்டும் அதன் தலையை இடது புறமாக வைத்து மார்புக்கு எதிராக நீண்டநேரம் மசாஜ் செய்ய வேண்டிய அவசியமில்லை மேலும் | மசாஜ் செய்த சிறிது நேரத்தில் சேவல்கள் விந்து வெளியேறுவதால் நீண்ட நேரம் மசாஜ் செய்ய வேண்டிய அவசியமில்லை |
|  | 04. | மசாஜ் செய்த உடனே கட்டுப்படுத்தவும். மெல்ல இடது முட்டுக்குக் கீழே அவரது தலையுடன் காற்றோட்டத்தை வெளிப்படுத்த கீழே வைக்கவும் | |
|  | 05.அழுத்தவும் | குளோகாவின் பக்கங்களை கட்டைவிரல் மற்றும் ஆள்காட்டிவிரலால் லேசாக அழுத்தி பிளியவும் மற்றும் விந்துவை பிளிந்துவிடும் | |

| | | | |
|---|---|---|---|
|   | 06.விந்தணுக்களை அறுவடை செய்தல் | விந்தணுக்களை அறுவடை செய்ய பிளாஸ்டிக் கோப்பையை காற்றோட்டத்தை கீழ் வைத்து விந்தணுக்களை சேகரித்தல் | |
|  | 07.தேவையன அளவு விந்தணுக்களை சேகரித்தல் | சிரிஞ்சில் தேவையான அளவு (0.3 ml) விந்தணுக்களை சேகரித்து pp குழாய்களுக்கு மாற்றவும் | |
|  | 08.தூய விந்தணுக்கள் | விந்தணுக்களை (0.3ml) எக்டென்சன் ஏஜென்டுடன் (சோடியம் குளுட்டமேட்)0.6ml ppகுளாயில் கவனமாக கலந்து கலவையில் வாயுகுமிழ்கள் இல்லாமல் இருப்பதை உறுதி செய்து மீண்டும் சிறிஞ்சில் சேகரிக்கவும் | |
|  | 09.பெண் கோழியை பிடிக்கவும் | முதலில் கூண்டை திறந்து இடதுகையை பயன்படுத்தி கோழியின் கால்களை பிடித்து வால் இறகுகள் உள்ளே இருக்க இழுக்கவும் | |
|  | 10.சேவல் கோழியின் பாதி உடலை வெளியே இழுக்கவும் | சேவல் கோழியின் இரண்டு தொடைகளையும் பிடிக்க கைகளை மாற்றவும் சேவல் கோழியின் உடலின் பாதியை மெதுவாக வெளியே இழுக்கவும் | |
|  | 11.கருவூட்டல் | கருவூட்டல் சிரிஞ்சை வலதுகையில் பிடித்து மெதுவாக 1-2cm ஆழத்தில் விந்தணுக்களை (0.1ml/கோழி) செலுத்தவும் | குழுக்காவில் இரண்டு பகுதிகள் உள்ளன ஒன்று மலக்குடல் மற்றும் இடது யோனி |
|  | 12.பயன்படுத்திய அனைத்துப் பொருட்களையும் /கருவிகளையும் ஒரே இடத்தில் சேகரித்து ஒன்றாக சேர்த்து அகற்றவும் | பயன்படுத்திய அனைத்துப் பொருட்களையும் /கருவிகளையும் ஒரே இடத்தில் சேகரித்து ஒன்றாக சேர்த்து அகற்றவும் | குழுக்காவில் இரண்டு பகுதிகள் உள்ளன ஒன்று மலக்குடல் மற்றும் இடது யோனி |

## සතුන්ගේ චර්යාවන් හඳුනා ගැනීම අපේ එදිනෙදා ජීවිතයට වැදගත් වන්නේ ඇයි?

එදිනෙදා ජීවිතයේ අප මැදිවී සිටින ආතතීන්ගෙන් මිදෙන්නට ගෘහාශ්‍රිත සුරතලුන් ලබා දෙන්නේ මහඟු අත්වැලක්. බළලුන් සහ සුනඛයින් ඒ සුරතලුන් අතර මූලික වෙනවා. මොවුන් ගෘහාශ්‍රිතව රැකබලා ගැනීමේදී නොවැරදීම ඔවුන්ට ජලභීතිකා එන්නත වාර්ෂිකව ලබා දිය යුතු බව ඔබ දැනටමත් දන්නවා.

ජලභීතිකා රෝගය මාරාන්තිකයි. එය මිනිසුන්ට බෝවන්නේ සත්ත්ව සපාකෑම් හරහා. ශ්‍රී ලංකාවේ වාර්තා වන ජලභීතිකා රෝගීන්ගේ මරණවලට ප්‍රධාන වශයෙන් හේතුවන්නේ බල්ලන්ගේ සපාකෑම්.

නමුත්, සුනඛයින්ගේ හැසිරීම් ගැන ඔබ දැනුවත් නම්, ඔවුන්ගේ සපා කෑම්වලට ලක් නොවී සිටින්නට ඔබට පුළුවන්. සුනඛයින් සමග ආරක්ෂාකාරීව කටයුතු කිරීම සපාකෑම් වැළැක්වීමට ඇති හොඳම පිළියමයි. එසේ කිරීමෙන් ඔබට ජලභීතිකා රෝගය පැතිරීම පාලනය කරන්නට පුළුවන්.

- නාඳුනන සුනඛයෙකු ඔබ දෙසට එනවිට දුවන්නට එපා. එසේ දිවීමෙන් ඔබ පසුපස හඹා එන්නට එම සුනඛයාට උත්තේජනයක් ලැබෙනවා.
- කෝපයෙන් හෝ තැති ගැන්වී සිටින සුනඛයෙකු වෙත ළං වෙන්නට එපා. සිය ආරක්ෂාව වෙනුවෙන් සුනඛයා ඔබ සපා කෑමට පෙළැඹෙනු ඇත.
- ආහාර ගනිමින් සිටින හෝ පැටවුන් සමග සිටින සුනඛයෙකු වෙත ළං වෙන්නට එපා. එයින් ඔවුන් කෝපයට හෝ කළබලයට පත් වෙන්නට පුළුවන්.
- නාඳුනන සුනඛයෙකු ඔබට ළං වන්නේ නම් නැවතී, නොසෙල්වී සිටින්න. කලබලයෙන් කෑ ගසමින් දඟලන්නට එපා. සුනඛයාගේ ඇස් දෙස එක එල්ලේ බලන්න එපා. ඔබගේ ප්‍රතිචාරයක් නැතිවිට සුනඛයා මග හැර යනු ඇත.
- අවශ්‍ය නම්, ළඟ සිටින පුද්ගලයෙකුගෙන් උපකාර ඉල්ලන්න. සුනඛයා ඔබ මග හැර සිටී නම් සෙමින් එතැනින් ඉවත් වන්න.

සුනඛයින් මිනිසා සමග බැඳෙන්නේ සීමාවන් තබාගෙන නොවේ. ඔවුන් හා ආදරයෙන්, ඉවසීමෙන් කටයුතු කිරීම එකිනෙකා වටහා ගැනීමට ඇති පහසුම මාර්ගයයි.

## நாயின் நடத்தை உங்களுக்கு நன்றாக தெரிந்திருந்தால், அது கடிப்பதை தடுக்கலாம்.

தெரியாத நாய்களுடன் பாதுகாப்பான அணுகுமுறையை பேணுவதன் மூலம் நாய்க் கடிகளிலிருந்து உங்களை பாதுகாக்கலாம்

விசர் நாய்க் கடி நோயை கட்டுப்பாட்டுக்குள் வைத்திருக்க, நாய்கள் கடிப்பதை தடுப்பது முக்கியமாகும்

ஓடாதீர்கள், ஓடினால் நாய்கள் உங்களை துரத்தும். அது பயத்துடன் அல்லது கோபமாக இருக்கும் போது அணுக வேண்டாம்.

நாய் அதன் குட்டிகளுடன் இருக்கும் போதோ, உண்ணும் போதோ தள்ளி இருங்கள். அந்நேரங்களில் குழப்பினால், அவை கோபமடையும்.

அமைதியை பேணி விலகி நடக்கவும்

தெரியாத நாய் ஒன்றை எதிர்கொள்ள நேரிட்டால், அசையாமல் நிற்கவும், கண் தொடர்பை தவிர்க்கவும், பதற்றம் அடையவோ, அலறவோ வேண்டாம். உதவிக்கு யாரையும் அழையுங்கள் அல்லது பாதுகாப்பாக உணரும் சந்தர்ப்பத்தில் விலகிச்செல்லுங்கள்.

அன்பு பொறுமை என்பன நீங்கள் பேசும் மொழியானால், நாய்கள் நிபந்தனையற்ற அன்பை வழங்கும்.




Concept and Guidance:
**Dr. Tharanga Thoradeniya**
**&**
**Dr. Deepani Jayantha**



Tamil translation:
**Miss. Aruljenani Kumutharanjan**
Undergraduate Student, Faculty of Medicine, Colombo



Art & creation by:
**Januli Sehansa Amarakoon** (12 years)
Musaeus College, Colombo


If you know dogs' behaviour well, you can prevent their bites
Safe interactions with unknown dogs save you from dog bites.
Preventing dog bites is key for rabies control.
Do not run, running will make the dog chase you.
Do not approach it when it's angry or scared.
Keep away from the dog especially when it is eating or with its puppies. They get angry when disturbed.
Keep calm & walk away
If you come across an unknown dog stand still, avoid eye contact & do not panic or scream. Call for help or walk away if it feel safe.
Dogs bring you unconditional love if affection and patience are the language you speak with them

# මොනවද මේ, ඇසොල්ලා (Azolla)

**වෛද්‍ය සමන්ත කුමාර සේනාරත්න**

ඇසොල්ලා යනු අතු රහිත පාවෙන ජලජ පර්ණාංගයක් වේ. එය ජලය මතුපිට වේගයෙන් වර්ධනය වේ.

## 01. ඇසොල්ලා සත්ව පාලනයේදී වැදගත් වන්නේ ඇයි ?

- ගවයන්, එළුවන්, බැටළුවන්, ඌරන්, කුකුලන්, හාවන් සහ මාළුවන් වැනි සතුන්ට කදිම තිරසාර අතිරේක ආහාරයක් ලෙස.
- ගොවිපොළෙහි ජෛව පොහොරක් ලෙස

## 02. ඇසොල්ලා ශාකයේ පෝෂණ සංයුතිය

| | වියලි ද්‍රව්‍යවල බරෙහි ප්‍රතිශතයක් ලෙස |
|---|---|
| වියලි ද්‍රව්‍ය | 5-7% |
| දළ ප්‍රෝටීන් | 20-30% |
| ඊතර් නිස්සාරණය | 4-5% |
| දළ තන්තු | 14-16% |
| සමස්ත අළු ප්‍රමාණය | 15-18% |

## 03. ඇසොල්ලා ශාකයේ ප්‍රයෝජන මොනවාද ?

- ඉහළ පෝෂණ ගුණයක් සහිත සත්ත්ව ආහාරයක් වීම.
- ප්‍රෝටීන්, අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල, විටමින් (විටමින් A, විටමින් B12, බීටා කැරොටීන්) සහ ඛනිජ (කැල්සියම්, පොස්පරස්, පොටෑසියම්, යකඩ කොපර්, මැග්නීසියම්) බහුලව අඩංගු වේ.
- සත්ත්ව විශේෂ ගණනාවකට ආහාරයක් ලෙස ලබා දියහැකි වීම (ගව, එළු, බැටළු, ඌරු, කුකුළු, මාළු )
- එහි වැඩි ප්‍රෝටීන් හා අඩු ලිග්නින් ප්‍රමාණයක් අඩංගු බැවින් ඉක්මණින් ජීර්ණය වේ.
- එය තනිවම හෝ සාන්ද්‍ර ආහාර සමග මිශ්‍ර කර සතුන්ට ලබා දීමට හැකිවීම.
- සීමිත ඉඩක අඩු වියදමකින් ඇසොල්ලා නිපදවා ගත හැකි වීම.
  (දිග, පළල සහ උස පිළිවෙලින් අඩි 6, 3 සහ 1 ප්‍රමාණයේ ඇසොල්ලා වගාවකින් දිනකට ඇසොල්ලා කිලෝ ග්‍රෑම් 1 ක් පමණ ලබා ගත හැක)
- ශීඝ්‍ර වර්ධනයක් නිසා දෛනිකව අතිරේක ආහාරයක් ලෙස සතුන්ට ලබාදිය හැකි වීම.
- අනෙක් බෝගයන් සඳහා අතිරේක ජෛව පොහොරක් ලෙස භාවිත කළ හැකිය
- ගවයන්ගේ කිරි නිෂ්පාදනය ද, කිකිළියන්ගේ බිත්තර නිෂ්පාදනය ද වැඩි කිරීමට දායක වේ.
- ගොවිපොළ සතුන්ගේ ආහාර සඳහා යන වියදම අඩු වීම.
- සතුන්ට සපයන ආහාරවල ගුණාත්මක භාවය ඉහළ දැමීමට හැකිවීම.

## 04. ඇසොල්ලා වගා කිරීමට අවශ්‍ය පරිසර තත්ව

| | |
|---|---|
| උෂ්ණත්වය | 20C° |
| ආලෝකය පූර්ණ හිරු එළියෙන් | 50% |
| සාපේක්ෂ ආර්ද්‍රතාව | 65-80% |
| වගා ටැංකියේ ජල මට්ටම | 5-12 CM |
| පී එච් අගය (PH) | 4-7.5 |

## 05. ඇසොල්ලා වගා කිරීම

- දිග X පළල X සහ උස පිළිවෙලින් අඩි 6 X 3 X 1 වලක් සෑදීමට අවශ්‍ය භූමිය පිරිසිදු කර මට්ටම් කර ගැනීම.
- වළෙහි හැඩය එන ආකාරයට වටේට ගඩොල් තබා වළෙහි පතුලට සහ බිත්තිවලට ඝනකම් පොලිතීනයක් ඇතිරීම.
- පොලිතීන් එහා මෙහා යාම වැළැක්වීමට වළෙහි බිත්තිවල ගඩොල් හෝ ලී කොට වැනි බර ද්‍රව්‍යයක් තැබීම
- හොඳින් හලා පිරිසිදුකරගත් සාරවත් පස් කිලෝ 10-15 ක් පමණ එක මට්ටමකට වළ තුළ ඇතිරීම.
- ගොම කිලෝ 2-3 ක් පමණ ජලය ලීටර් 10ක් සමග මිශ්‍ර කර සාදාගත් මිශ්‍රණය වළ තුළ අතුරා ගැනීම.
- ඉන් පසු සෙන්ටිමීටර් 12-15 ත් පමණ ගැඹුරට පිරිසිදු ජලයෙන් වළ පුරවා ගැනීම.
- ඇසොල්ලා වගාවේ නිරෝගීභාවය වැඩිකර ගැනීම සඳහා සුපර් පොස්පේට් හෝ රොක් පොස්පේට් ග්‍රෑම් 10-15ක් අතර ප්‍රමාණයක් එකතු කර ගැනීම.
- ඉන්පසු සකස්කරගත් වළ දින 2 - 3 ත් අතර කාලයක් පරණ වීමට ඉඩ හැරීම.
- මේ ආකාරයට සකස්කර ගත් ජල පොකුණට ඇසොල්ලා බීජ කිලෝ 1 ක් පමණ මතුපිටින් විසුරුවා හැරීම.
- පොකුණට ඇසොල්ලා බීජ එකතු කර දින 10-15 ත් අතර කාලයකට පසුව ප්‍රශස්ත පරිසර තත්ව යටතේ දිනකට කිලෝ 1 1/2 ක් පමණ ඇසොල්ලා අස්වැන්නක් අපට ලබා ගත හැක.



## 06. ඇසොල්ලා අස්වැන්න නෙලීම

මේ සඳහා ප්ලාස්ටික් හෝ ඇලුමිනියම් පෙනේරයක් භාවිත කළ හැකිය.

## 07. ඇසොල්ලා සතුන්ට ලබා දීම

- ඇසොල්ලා සතුන්ට ලබා දීමට ප්‍රථම ගොම දුර්ගන්ධය ඉවත් වීමට හොඳින් සෝදා ගත යුතුයි.
- ඇසොල්ලා සතුන්ට තනිවම හෝ වෙනත් ආහාර සමග (සහල්, නිවුඩු, සාන්ද්‍ර, ආහාර, පිදුරු වියළි හෝ සංරක්ෂණය කරන ලද තෘණ) මිශ්‍ර කර ලබාදිය හැකිය.

## 08. ඇසොල්ලා ලබා දිය යුතු ප්‍රමාණයන්

| සත්ත්ව විශේෂය | දිනකට ලබාදිය යුතු ප්‍රමාණයන් (වෙනත් ආහාර සමග මිශ්‍රකර) |
|---|---|
| ගවයන් | කි.ග්‍රෑ. 1-2 |
| එළුවන් | ග්‍රෑම් 400 -500 |
| කිකිළියකට | ග්‍රෑම් 75 - 100 |

## 09. ඇසොල්ලා පොකුණ නඩත්තුව

- දින 10 -15 කට වරක් පරණ ජලය ඉවත් කර අලුත් ජලය පිරවිය යුතුයි.
- ඇසොල්ලා ශාකය ජලයේ පාවී පවත්වා ගැනීම සඳහා ජල මට්ටම සෙ. මී. 10ක් ගැඹුරට රඳවා ගත යුතුයි
- වඩා හොඳ නිරෝගී වර්ධනයක් සඳහා සති 2 කට වරක් දින 4 - 5 ක් පමණ පරණ වූ ගොම කි.ග්‍රෑ. 1 සහ සුපර් පොස්පේට් හෝ රොක් පොස්පේට් ග්‍රෑම් 30 ක් යෙදිය යුතුය.
- මෙම පොකුණ මාස 6 - 8 කට වරක් හිස් කර පස් මිශ්‍රණය අලුත් ගොම දියර මිශ්‍රණය සහ අලුත් ඇසොල්ලා රෝපණයක් ද ජලය ද අලුතින් යොදා නැවත අලුත් වගාවක් ඇරඹිය යුතුය.
- අධික වර්ෂාව පවතින දිනවල පොකුණේ ජලය පිටාර ගැලීම වැළැක්වීමට දැලකින් ආවරණය කරන ලද කුඩා බට කැබැල්ලක් පොකුණේ මතුපිට මට්ටමෙන් සවි කළ යුතුය.
- පොකුණ තුළ ඇසොල්ලා වගාව අධිකව වර්ධනය වීම වැළැක්වීමට දිනපතාම අස්වැන්න නෙලාගත යුතුය.



# හොඳ කරන්න බැරි ලෙඩ සතුන්ට මැරෙන්න බෙහෙත් විදිනවා ද?

**වෛද්‍ය උදිත විජේසිංහ**

ගිනිගහන පැවිල්ලෙන් ගත සිත පීඩාවට පත් කරන තවත් සුපුරුදු කාෂ්ටක දවසක් විල්ගමුවට උදා වී තිබුණි. රාජකාරි අරඹා මාස කිහිපයක් ගත වී තිබුණ ද එම ප්‍රදේශයේ අත්දකින සම ගැලවී වැටෙන තරම් වන උණුසුම් කාලගුණයට පූර්ණ ලෙසම අනුවර්තනය වීමට ඒ වන විටත් මට හැකිව තිබුණේ නැත. ඉඳහිට හමන සුළං රළකින් හෝ සහනයක් ලබා ගැනීමේ අරමුණින් කාර්යාලයේ මිදුලට වී සිටින විට ත්‍රීරෝද රථයක් පැමිනුණි.

ප්‍රදේශයට සාපේක්ෂව හොඳින් ඇඳ පැළඳ සිටි කාන්තාවක් ඉන් බැසගත් අතර ඇය පිටුපසින් දුඹුරු පැහැති බල්ලෙකු ද එළියට පැන ගත්තේ කෙළිදෙලෙන් වලිගය වනමිනි. මගේ නෙත් එක්වරම එම සතා ගේ ලිංගික අවයව ළඟ නතර වූයේ එහි තිබූ අසාමාන්‍ය විශාලත්වය නිසාමය.

''බල්ලා දවස් දෙක තුනක් කෑම කන්නේ නෑ ඩොක්ටර්....'' රෝග පරීක්ෂා කිරීමට මේසය මතට බල්ලා දමන අතරම ඈ රෝග නිධානය ඉදිරි පත් කිරීම ඇරඹුවා ය.

''නම මොකද් ද මෙයාගේ..?''

''ටිමී''

කවද ඉඳල ද මේක මෙච්චර ලොකු වෙලා තියෙන්නේ'' ඇය ඉදිරිපත් කරන රෝග නිධානයට අවධානය යොමු කිරීම වඩා සුදුසු වුව ද ඊට ඉවසීමක් නැති මම විශාල ලිංගික අවයවය වෙත අත යොමා ඇසුවෙමි.

''ඕක දැන් මාස හය හතක් ඔහොම තමයි. ඕක නිසා නෙමෙයි ඩොක්ටර් කන්නේ නැත්තේ, මොකද දැන් දවස් තුන හතරකට කලිනුත් හොදට කෑවා.'' මට රෝග විනිශ්චයකට පැමිණීමට පහසු වන සේ ඉතාමත්ම තර්කානුකූලව ඇය තම මතය ඉදිරිපත් කරයි. ඈට සවන් දෙන අතරම රබර් අත් ආවරණ යුවළක් පැලඳ ගත් මම සතා පරික්ෂා කරමින් ලිංගික අවයවයේ පෙර සම පිටුපසට ඇද්දෙමි.

මල් ගෝවා ගෙඩියක මෙන් (Cauliflower) වර්ධනය වී තිබූ මස්දළු දකින විට රෝගය හඳුනාගැනීම අපහසු වූයේ නැත. එම සතාට තිබුනේ ලිංගාශ්‍රිතව බෝවන TVT (Transmisible Venereal Tumor) නමැති රෝග තත්වයයි.

එතරම් විශාල ලෙස වර්ධනය වූ මස් දලු අද වනතුරුත් මම දැක නැත. දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රමාණුකූල ව වර්ධනය වී තිබූ ඒ මස් දලු මා තැති ගන්වන්නට සමත් විය.

''මෙතනින් ලේ බිංදු වැටෙනවා ද?'' සැකයක් නැති වුණත් රෝග විනිශ්චය තහවුරු කරගැනීම වෙනුවෙන් ඇසුවෙමි.

''ඔව් ඩොක්ටර් ඇවිදිනකොට බිංදුව බිංදුව වැටෙනවා. ලැගලා ඉන්න තැනත් ලේ වැටිලා තියෙනවා'' මේ රෝගයෙන් බල්ලාට ලොකු අපහසුවක් ඇති නොවුවද අයිතිකරුවන්ට මහත් හිසරදයකි. සාමාන්‍යයෙන් බොහෝ දෙනෙකු ප්‍රතිකාර ගැනීමට තම බල්ලා කැටුව එන්නේ මෙලෙස ලේ බිංදුව බිංදුව වැස්සෙන නිසා ය.

''ඇයි ඉතින් මෙච්චර ලොකු වෙනකම් බෙහෙත් ගන්න ආවේ නැත්තේ?''

''අපි හිතුවේ ඕකට බෙහෙත් නැතුව ඇති කියලා" තම සුරතලා රෝගී වූ විට පශු වෛද්‍යවරයකු ළඟට ගෙන නොයාමට ඇති කප්පරක් සාධාරණ හේතු අතරින් එකක් ඇය විසින් ඉදිරිපත් කළා ය. එය උපේක්ෂාවෙන් අසා සිටි මම රෝගය ගැන ඇයට පැහැදිලි කරදීම ඇරඹුවෙමි.

''මේක ලිංගිකව බෝවෙන ලෙඩක්, හරියට ඒඩ්ස් වගේ''

''අපිටත් බෝවෙන්න පුළුවන් ද?'' ඇය කලබලයෙන් විචාළාය. ඇගේ සිතට ආ තැතිගැන්ම ඒ වචන වල ගැබ්වී තිබුණි.

''අපෝ නෑ ඒඩ්ස් වගේ කිව්වේ ලිංගිකව බෝවන හින්දා. ඒත් අපිට බෝ වෙන්නේ නෑ.'' ඇගේ සිතට දැණුන සහනය පිටවූ සැනසුම් සුසුමේ ගැබ්ව තිබුණි.

''ඒත් සතා මෙච්චර දුක් විඳිද්දී ඇයි බෙහෙත් ගන්න ආවෙ නැත්තේ'' මම යලිත් ඇසූවේ නිශ්චිත උත්තරයක් බලාපොරොත්තුව නොවේ.

"ඩොක්ටර් මේ ලෙඩේ හොඳ කරන්න පුලුවන් ද?'' ඇය උනන්දුවෙන් අසයි.



''ඔව් හොඳ කරන්න පුළුවන්, හැබැයි මේකට ඕන බෙහෙත් එක මා ගාව නෑ. මම ලියලා දෙන්නම් ගෙනාවොත් විදලා දෙන්න පුළුවන්'' මේ රෝගයට ප්‍රතිකාර ලෙස පාවිච්චි කරන්නේ පිළිකා නාශක ඖෂධයකි.

ඒ අතරතුර දින කිහිපයක් ආහාර නොගැනීමට හේතුව සොයා බලා ඊට අදාල ප්‍රතිකාර සිදු කළෙමි. TVT රෝගයට ප්‍රතිකාර කිරීමට අවශ්‍ය ඖෂධ බෝතලයක් මිලදී ගැනීමට අවශ්‍ය වන බෙහෙත් තුණ්ඩුවක් ලියා ඇය අත තබන අතරම "මෙහෙ නම් නැති වෙයි මයියංගනයේ වත් බලන්න" යැයි වැඩිදුරටත් කීවෙමි. ඉතාමත් දුෂ්කර ප්‍රදේශයක් වූ විල්ගමුවෙන් මේ ඖෂධය සොයා ගැනීමට ඉඩක් නැත.

මාස හයක් තිස්සේ දුක් විඳි සතා දෙස නොබැලූ ඇය කිලෝ මීටර් හතළිහක් දුර මහියන්ගනේට ගොස් ඖෂධය ගෙන එනු ඇතැයි ලොකු විශ්වාසයක් තිබුණේ නැත. ඉන් පසු ඒ පිළිබඳ මතකය මගේ සිතින් ගිලිහුණි.

''ඩොක්ටර් අර බෙහෙත් බෝතලයක් ගෙනාවා විද ගන්න කියලා ආවේ..''

''මොන?'' විශාල වූ ලිංගේන්ද්‍රය සහිතව වලිගය වනමින් මා දෙස බලා සිටින දුඹුරු පාට ටිමී දුටු විට මගේ මතකය අලුත් විය.

''මහියන්ගනේ තිබුණෙ නැහැ, බස් එකේ මල්ලි කෙනෙක්ට කියලා නුවරින් ගෙන්නා ගත්තේ'' මාස හයකටත් වැඩි කාලයක් ප්‍රතිකාර නොකර තිබුනේ එම රෝගය සුව කිරීමට ක්‍රමයක් නැතැයි ඇය අවංකවම සිතූ නිසා විය යුතුය. ප්‍රතිකාර තිබෙනවා කියා දැනගත් විට නුවරින් බෙහෙත ගෙන්වාගෙන විද ගන්නට ඇති උනන්දුව එම මතය තහවුරු කරයි.

''වෙන අමාරුවක් නැනේ... ? කාලා බීලා ඉන්නවා නේද?''

''ඔව් ඩොක්ටර්..'' වෙනත් රෝගී තත්වයක් පෙනෙන්නට නොතිබූ බැවින් අදාල ඖෂධය සතාගේ නහරයකට ඇතුළු කළෙමි. ඖෂධ බෝතලේ ඉතිරි කොටස ශීතකරණයේ තැබූ මම යළි පැමිණ දෙවන මාත්‍රාව විද ගන්නා ලෙසත් උපදෙස් දුන්නෙමි.

එම සතාගේ තුවාල වල තිබූ විශාලත්වය අනුව නියත ලෙසම දෙවන මාත්‍රාව විදීම අත්‍යවශ්‍ය ය. බෙහෙත් එක ගෙන්වා ගැනීමට තිබූ උනන්දුව මත ඇය දෙවන මාත්‍රාව විද ගැනීමට එනු ඇතැයි ලොකු විශ්වාසයක් මට තිබුණි.

එනමුත් ඇය ටිමී සමගින් පැමිණියේ නැත. සමහර විට එක මාත්‍රාවෙන්ම සුව වූවා විය හැක.

තවත් මාස පහක පමණ ඇවෑමෙන් සුදු හා දුඹුරු මිශ්‍ර බලු පැටවකු රැගෙන ඇය කාර්යාලයට පැමිණුනි. එවර මට එක්වරම ඇය මතක් කර ගත හැකිවි ය.

''ඇයි ටිමීට දෙවැනි ඉන්ජෙක්ෂන් එක විදින්න එක්කරගෙන ආවේ නැත්තේ?''

''ටිමී මැරුණනේ ඩොක්ටර්''

''ආහ්... මොනා වෙලා ද?'' ඇගේ අනපේක්ෂිත උත්තරයෙන් කම්පාවට පත් වූ මම ඇසුවෙමි. එයට උත්තර දීමට ඇය ගේ එතරම් කැමැත්තක් නැති ආකාරයක් පෙනෙන්නට තිබුණි.

''ඇයි මොකද උනේ ?''

''නෑ ඩොක්ටර්...''

''නෑ කිව්වේ...?''

''බෙහෙත් විදගෙන ගිහිල්ලා සති දෙකකින් විතර දවස් දෙක තුනක් කන්නේ නැතුව ඉඳල මැරිලා ගියා''

''ඇයි ඉතින් අසනීප වුණ වෙලේ බෙහෙත් ගන්න ආවේ නැත්තේ..?''

''ම්.. නෑ..''

''අපරාදෙනේ...''

''හොඳ කරන්න බැරි ලෙඩ්ඩුන්ට මැරෙන්න බෙහෙත් දීලා ගෙවල්වලට එවනවා කියලා ගමේ කෙනෙක් කිව්වා..''

''මොකක්?'' ඇගේ අනපේක්ෂිත ප්‍රකාශයෙන් ගල්ගැසී වචන ගළපන්නට නොහැකිව සිටින අතරතුර ඇය තම වාක්‍ය සම්පූර්ණ කළා ය.



''අපි හිතුවේ ආණ්ඩුවෙන් මේ වගේ හොඳ කරන්න බැරි බල්ලන්ටත් මැරෙන්න බෙහෙත් විදිනවා කියලා .... '' ඇය වඩා වඩාත් කාරුණික ලෙස චෝදනාව මට ඉදිරිපත් නොකර ආණ්ඩුවට වැරැද්ද පැටවූවා ය.

ඉස්සර ඉඳන්ම ආණ්ඩුවේ බලු වෑන් එකෙන් බල්ලො මරණ හින්දා මමත් බල්ලා මැරෙන්න ඉන්ජෙක්ෂන් එකක් ගැහුවා කියලා හිතපු එක එක අතකට සාධාරණීකරණය කළ හැකි ය. ඒත් හොඳ කරන්න බැරි ලෙඩ්ඩුන්ට මැරෙන්න බෙහෙත් විදලා ගෙදර යවනවා කියන ප්‍රකාශය එසේ සුළුවෙන් බැහැර කළ නොහැකි ය. ජනතාව අතර ඉහළ විශ්වාසයක් තිබිය යුතු වන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීත්වය ගැන ඇගේ එම ප්‍රතිචාරය මා බෙහෙවින් කම්පාවට පත් කරන්නට සමත් විය.

''පිස්සු ද? එහෙම ලෙඩ හොඳ කරන්න බැරිවුණා කියලා මැරෙන්න බෙහෙත් විදලා ගෙවල් වලට එවන්නේ නැහැ.''

''අපිත් විශ්වාස කරන්නේ නැහැ ඩොක්ටර් ගමේ අය තමා ඉතින් එහෙම කිව්වේ..'' තමන් හොඳ කෙනෙකු වී ගමේ අය නරක දේවල් කරන, කියන අවස්ථා නිරන්තරයෙන්ම අපිට අසන්නට, දකින්නට ලැබේ.

''ඉතින් මම විද්දේ ඔයාලම ගෙනත් දුන්න බෙහෙතනේ.'' අඩුම වශයෙන් මගේ ගෞරවය හෝ බේරා ගැනීමේ අදහසින් යුතුව කීවෙමි.

''අපි එහෙම හිතන්නේ නැහැ සර්, ගමේ අය තමයි එහෙම කිව්වේ.'' ඒ බරපතල ප්‍රකාශයේ වගකීම භාර නොගෙන ගමේ අය මත යළිත් පටවමින් ඇය කියා සිටියා ය.

ප්‍රතිකාර සඳහා ඉදිරිපත් කරන සතෙකු මැරෙන්නට බෙහෙත් ගසන අයෙකු ලෙස අප දෙස බලනවායැයි දැන ගැනීම අප මහත් කම්පනයට ලක් කරන්නකි. අපේ ජීවිතයේ විවිධ අවස්ථාවලදී රාජකාරී හෝ වෙනයම් මට්ටමකින් සිදු කරන ක්‍රියා පිළිබඳව අපි බොහෝ විට සිටින්නේ ඉමහත් සංතෝෂයෙනි. ඒ දේවල් ගැන වෙනත් අය සම්පූර්ණයෙන් ම වෙනස් අන්දමින් තේරුම් ගෙන එම කාර්යය ගැන නිර්වචන දෙනු ලබයි. එසේ තීරණයකට එන්නේ ඔවුන් ජීවිත කාලය පුරාම සමාජයෙන් එකතු කරගන්නා දැනුම හා අත්දැකීම් උපයෝගී කරගෙන ය. ඒ ගැන කම්පා වීමෙන් පලක් නැත. එකිනෙකාට බොහෝ සේ වෙනස් ජනතාවක් සමඟ සමීප ව කටයුතු කිරීමේදී ඇතිවන මෙවන් සිත් රිදවීම් විඳදරා ගැනීමේ හැකියාව, ජීවිතයට සතුටින් මුහුණ දීමට අත්‍යවශ්‍ය ය.

# LOOK
# LISTEN
# REPORT..!

**YOU HAVE THE RIGHT TO REMAIN SILENT..
BUT IF YOU DO, OUR ANIMALS PAY THE PRICE.!
CHANGE ATTITUDES, BE INCLUSIVE AND
WORK TOGETHER TO MAKE ANIMAL WELFARE
AND PROTECTION OF OUR ANIMAL
A SOCIAL RESPONSIBILITY,**




# THEN IMMEDIATELY
# REPORT TO




- **Police 119 or direct to your Local Police**
  Contact numbers can be got from 1919 Government Citizen Information Line
- **Wild Life Department 1991/1992 or 011288585**
- **Livestock 119 or direct to your Local Police**
  Contact numbers can be got from 1919 Government Citizen Information Line
  or
  **Direct to the relevant Province Department of Animal Production and Health (DAPH) Office**
  Contact numbers can be got from 1919 Government Citizen Information Line



**Your Vigilance stops
Animals Being Harmed...!**

NEIGHBOURHOOD WATCH
IN ACTION

**By Practicing the
BLUE CROSS CODE**
You raise awareness to protect our animal
LET OUT THE SOCIAL RESPONSIBLEITY FORCE IN YOU..!

**Chrishanthi Perera**
Founder
Randi Foundation
A Strong Voice For Animal Welfare

Randi
FOUNDATION

# FARMCHEMIE (Private) Limited

# Feed Chemie (Private) Limited

## *Pinnacle of Animal Nutrition & Health*

members of
DYVESTA
• Dynamic • Diverse • Devoted

MEDIVESTA SYNTHEMICA




**FARMCHEMIE**
**20 YEARS EXCELLENCE IN ANIMAL HEALTH**
**2002-2022**




Manufacturing Premium Quality veterinary pharmaceuticals, Feed additives & supplements for livestock & pet care markets

With the careful application of science to develop unprecedented technologies
&
With automated production lines adhering to International manufacturing standards







No : 76, Industrial Zone, Katuwana, Homagama.
Tel : 0112895734 Fax : 0112895732
Web : www.farmchemie.com Email : sales@farmchemie.com

ISO 9001:2015 & WHO-GMP
INTERNATIONAL QUALITY SYSTEMS CERTIFIED
FAMI QS  GMP+  SGS  UKAS